# 3

# කතන්දර තුළින් මතුවන සමාජ වැඩ මෙවලම් : ඉසබෙලා ගොත ගැසූ කුමරියගේ කතාව පිළිබඳ විමර්ශනයක්

**චන්දිමා ජයසේන, කථිකාචාර්ය**

**සංක්ෂිප්තය**

*නව ලිබරල්වාදී සමාජය තුළ අවධානම් කණ්ඩායම් හා සෘජුව බැඳී පවතින ආබාධ සහිත ප්‍රජාව දැඩි අනාරක්ෂිත ප්‍රජාවක් ලෙස හඳුනාගත හැකිය. එය ආබාධ සහිත බව නිසා පමණක් නොවන අතර, ඒ හා බැඳී පවතින විවිධාකාරයේ සමාජ නිර්මිතයන් නිසාත් ඔවුන්ගේ එදිනෙදා ජීවිතය පවත්වාගෙන යාමේ දී අවධානම් කණ්ඩායම් කුලකයට ඇතුළත් කළ හැකිය. මෙම ප්‍රජාවන්ට සිදුවන පෞද්ගලික අනාරක්ෂිතභාවයන් ද, සමාජ සංස්ථා මඟින් සිදුවන සමාජ අපහරණයන් ද වෙනස් කිරීමේ ප්‍රමුඛ කාර්යභාරය සමාජ වැඩ වෘත්තිකයින්ට පැවරී ඇත. සමාජය තුළ ඔවුන්ගේ පුද්ගල ගරුත්වය, වටිනාකම සහ නිදහස පිරි සමාජයක් ගොඩනැගීම පහසු කාර්යභාරයක් නොවේ. ඒ සඳහා න්‍යායාත්මක දැනුම මෙන්ම කුසලතා සහ ආකල්ප යන ත්‍රිත්වයම නිර්මාණශීලී ලෙස යොදා ගැනීමට සමාජ වැඩ භාවිතයෙහි දී කතන්දර (Story telling) යොදාගත හැකි ආකාරය මෙම ශාස්ත්‍රීය ලිපියෙන් සාකච්ඡා කරනු ලබයි. ද්විතීය මූලාශ්‍ර භාවිත කරමින්, බෙයටා ඇකර්මන් විසින් රචිත, සුභාංගී හේරත් විසින් පරිවර්තනය කරන ලද "ඉසබෙලා: ගොත ගසන කුමරියගේ කථාව" අබාධ සහිත ප්‍රජාව පිළිබඳ ගැටලුව ආමන්ත්‍රණය කිරීමට කතන්දර සමාජ වැඩ මෙවලමක් ලෙස යොදා ගත හැකි ආකාරය මෙම ලිපියෙන් සාකච්ඡා කෙරේ.*

**මුඛ්‍ය පද:** *අවධානම් සංකල්පය, නව ලිබරල්වාදය, ආබාධ සහිත ප්‍රජාව, සමාජ නිර්මිතයන්, සමාජ වැඩ මෙවලම්*

**හැඳින්වීම**

අතීතයේ සිට මිනිසුන් කතන්දර පවසා ඇත. සමහර විට භාෂාවේ ආරම්භයේ සිටම කතන්දර කීම දැනුම හා තොරතුරු සම්ප්‍රේෂණය කිරීමේ ක්‍රමයක් ලෙස පැවති බවට උපකල්පනය කළ හැකිය. කතන්දරවලින් කියවෙන්නේ අප කවුරුන්ද, ලෝකය ක්‍රියා කරන ආකාරය සහ අප ජීවත් විය යුතු සාරධර්ම මොනවාද යන්නයි. අපට ඇති දේ, නැති දේ සහ ඕනෑම දෙයක් අපගේ සාමාන්‍ය ලෝකයෙන් ඔබ්බට ගිය දේ කතන්දරවලින් අපට කියා දෙනු ලබයි (Janssen, 2013). සමාජ වැඩ වෘත්තීය භාවිතයෙහි දී කතන්දර ප්‍රබල වැදගත්කමක් උසුලයි. සමාජ වැඩ වෘත්තීය භාවිතය තුල පුද්ගල, කණ්ඩායම් සහ ප්‍රජාවන් ඔවුන්ගේ ජීවන ඉතිහාසය තුළ අසන්නට කියන්නට උත්සාහ කළ කතන්දර ඔවුන්ගේ

සංස්කෘතික අංගයන් හා බැඳී බවතින බව දාර්යා ෂර්විෂෙක් සඳහන් කරයි. ඇය තවදුරටත් දක්වන්නේ, “මිනිසුන් විසින් මතක තබා ගැනීමේ සංස්කෘතිය එදිනෙදා ජීවිතයේ ප්‍රජාත්නත්‍රීකරණයේ වැදගත් අංගයක් වී ඇති බවයි” (Zervishek, 2008 ). කතන්දර මඟින පුද්ගල ජීවිතයේ ළමා අවධියේ සිටම පරිකල්පන ශක්තිය වර්ධනය කරමින් අප කවුරුන්ද, ලෝකය ක්‍රියා කරන ආකාරය, අප ජීවත් විය යුතු ආකාරය සහ අනුගමනය කළ යුතු සාරධර්ම පොදුවේ හඳුනාගත හැකිය. නමුත් මෙම ශාස්ත්‍රීය ලිපියෙන් තර්ක කරන්නේ පොදු කතිකාව තුළ ඇති කතන්දර කීම සහ ඇසීම සමාජ වැඩ භාවිතය තුළ සමාජය වෙනස් කිරීමේ මෙවලමක් ලෙස යොදා ගත හැක්කේ කෙසේද යන්න ප්‍රධාන පර්යේෂණ ගැටලුවයි. එකී පර්යේෂණ ගැටලුවට අනුව පර්යේෂණ අරමුණු පහත දැක්වේ.

**පර්යේෂණ අරමුණ**

ඉහත සඳහන් කළ ආකාරයට ආබාධ සහිත ප්‍රජාව හා බැඳි සංකීර්ණ සමාජ ගැටලුවලට මැදිහත්වීම සඳහා සමාජ වැඩ මෙවලමක් වන කතන්දර කීම යොදාගත හැකි ආකාරයේ උපයෝගීතාවය පිළිබඳව විමසීම මෙම ශාස්ත්‍රීය ලිපියෙන් සිදු කෙරේ.

**පර්යේෂණ ක්‍රමවේදය**

ඉහත පර්යේෂණ අරමුණ ඉටු කරගැනීම සඳහා පර්යේෂිකාව විසින් ද්විතීයික මූලාශ්‍ර අදාළ ප්‍රස්තුතය සනාථ කිරීම සඳහා යොදාගන්නා ලදී.

තෝරාගත් කෘතිය විශ්ලේෂණ කිරීම සඳහා ද්විතීයික මූලාශ්‍ර ලෙස සමාජ වැඩ විෂයට අදාළ අන්තර්ජාල අධ්‍යයන ප්‍රකාශන, පුවත් ලිපි, සහ පර්යේෂණ කෘති යනාදිය අදාළ පර්යේෂණ අරමුණු අර්ථකතනය සහ විශ්ලේෂණය කිරීම සඳහා උපයෝගී කරගන්නා ලදී. ඒ අනුව ඉසබෙලා කෘතියෙහි අන්තර්ගත ආබාධ සහිත දැරිවියකගේ අත්දැකීම කතන්දර කීම යන මෙවලම තුළින් සමාන්‍ය සමාජයට දැනවිය හැකි ආකාරය ගුණාත්මකව විශ්ලේෂණය මෙහි දී ගොඩනගන ලදී.

**ආබාධ සහිත ප්‍රජාව සංකල්පීයකරණය**

ආබාධ සහිත ප්‍රජාව නිර්වචනය කිරීම සංකීර්ණ කාර්යයකි. එමගින් විශද වන ක්‍රියාකාරකම් සීමා සහ සහභාගීත්ව සීමාවන් මෙකී පදයෙන් ආවරණය කරයි. සාමාන්‍යයෙන් හානියක් යනු ශරීරයේ ක්‍රියාකාරීත්වයේ හෝ ව්‍යුහයේ ඇතිවන ගැටලුවකි. යම් කාර්යයක් හෝ ක්‍රියාවක් සිදු කිරීමේ දී ක්‍රියාකාරකම් සීමා කිරීම සිදුවන අතර පුද්ගලයෙකුට ඇති වන දුෂ්කරතා සීමාවක් දක්නට ඇත. මෙය පුද්ගලයෙකුට ජීවිතයේ විවිධ තත්වයන්ට සම්බන්ධවීමේ දී අත්විඳිය හැකි ගැටලුවකි.

මේ අනුව ආබාධිතභාවය යනු සංකීර්ණ සංසිද්ධියක් වන අතර එය පුද්ගලයෙකුගේ ශරීරයේ ලක්ෂණ සහ ඔහු හෝ ඇය ජීවත්වන සමාජයේ නිර්මාණයක් බව අන්තර්ක්‍රියා මගින් වැඩිදුරටත් පිළිබිඹු වේ (isabled, 2009). ආබාධ සහිත ප්‍රජාව පිළිබඳව සාකච්ඡා කිරීමේ දී ඔවුන්ට සමාජ සංස්ථා සමඟ ගණුදෙණු කිරීමේ දී මුහුණ දීමට සිදුවන ගැටලු සරල නොවේ. පුද්ගල අන්තර්ක්‍රියා හේතුවෙන් ඇතිවන සමාජ අවමානය ආබාධ සහිත

පුද්ගලයින්ට දීර්ඝකාලීන බලපෑම් ඇති කරනු ලබයි. ඒ නිසා පුද්ගලයාගේ සමාජ ජීවිතයට දැඩි බලපෑමක් විවිධ සමාජ අවස්ථාවන් සමග සම්බන්ධ වීමේ දී ඇති කරනු ලැබේ. සමාජ අවමානයට ලක්වීම හේතුවෙන් ඇති කරනු ලබන බලපෑම් පුද්ගලයාට දිගු කාලීන වශයෙන් නිශේධනාත්මක බලපෑම් ඇති කෙරේ (Money, 2000).

ආබාධ සහිත ප්‍රජාවගේ ජීවිතයේ සමස්ත අත්දැකීම් පුද්ගල අන්තර් ක්‍රියා පැවැත්වීමේ දී මෙන්ම ස්වයං අනන්‍යතාවයන් ගොඩනැගීමට සහ ආත්ම සාක්ෂාත්කරණයට සෘජුවම බලපාන ආකාරය ආබාධ සහිත ප්‍රජාව සම්බන්ධ සාහිත්‍යය ගවේශණයෙන් පැහැදිලි වේ. මෙම ප්‍රජාවගේ අත්දැකීම් නොසලකා හැරිය නොහැකිය. ඔවුන්ගේ ජීවිතයේ මුහුණ දෙන අනේකවිධ අත්දැකීම් කතන්දර තුළින් ඔවුන්ගේ ජීවිත කැඩපත් නිරූපණය කිරීමක් ද වෙයි.

මෙකී සංදර්භය තුළ මෙම ලිපියේ ප්‍රධාන පර්යේෂණ අරමුණු වෙත අවධානය යොමුකළ හැකිය. බෙයටා ඇකර්මන් විසින් රචනා කළ, සුභාංගි හේරත් පරිවර්තනය කළ ඉසබෙලා කෘතියෙහි (හේරත්, 2018) එන ගොත ගසන කුමරියගේ කතන්දරය සමාජ වැඩ මෙවලමක් ලෙස යොදා ගත යුත්තේ කෙසේදැයි විමර්ශනය කිරීම වඩා වැදගත් වේ. උප අරමුණ අතර මෙම උපදේශනාත්මක ළමා කතාවේ ඇති සුවිශේෂතා සමාජ වැඩ වෘත්තියෙහි සමාජ අපහරණයට ලක් වූ ප්‍රජාවන් සවිබලගැන්වීමේ දී කෙතරම් දුරට වලංගු ද යන්නත් සොයා බැලීමට හැකිය.

සමාජයේ සැබෑ වෙනසක් අපේක්ෂාවෙන් හඬක් නැති ප්‍රජාවන් වෙනුවෙන් හඬක් ගොඩනගන්නට ප්‍රබල මැදිහත්වීමක් කරන සමාජ වැඩ වෘත්තිකයින්ට කතන්දර තුළින් අදාළ ගැටලුවේ බරපතල බව පෙන්වා දීමට අවස්ථාවක් ද කරගත හැකිය.

**තෝරාගත් කෘතිය පිළිබඳ සාකච්ඡාව**

ඉසබෙලා ගොත ගැසූ කුමරියගේ කතාවේ මුල් කතුවරිය වන බෙයටා ඇකර්මන්ගේ ජීවන අත්දැකීම් සෘජුවම මෙම කෘතිය රචනා වීමේ දී යොදාගෙන තිබේ. ඇය උපතින්ම කථන ආබාධ සහිත කාන්තාවක් නිසා ළමා වියේ සිට ඇයට මුහුණ දීමට සිදුවන අත්දැකීම් කතන්දරයක් ලෙස ගොඩනැගීම ඇගේ ජීවන තොරතුරු ඇතුළත් අන්තර්ජාල පිටුවෙන් පවා පැහැදිලි විය (Acerman, 2013). පුංචි කාලයේ සිට එම හිංසනකාරී ජීවන අත්දැකම්වලට ගොදුරු වීමත් සමාජ වැඩ වෘත්තිකයෙකුට වටිනාකමක් සහිත කතන්දර මඟින් වෘත්තීය මැදිහත් වීමේ දී ප්‍රබල ජීවි ගුණයක් සපයනු ලබයි. සමාජ වැඩ යනු කතන්දර කීම (Story telling) කථාවල තේරුම සහ සාක්ෂිවල වැදගත්කමට ප්‍රබල වටිනාකමක් ලබා දෙන විෂය පථයක් වේ. ජීවන අත්දැකීමක් කතන්දරයක් ලෙස ගොඩනැගීම සමාජ වැඩ භාවිතය අතර ඇති ගැඹුරු සම්බන්ධයක් නිරාවරණය වීම ද දැක්විය හැකිය (Zervishek, 2008).

චිරාත් කාලයක් තිස්සේ විවිධ සංස්කෘතීන්වල කතන්දර කීම ප්‍රධාන සංස්කෘතික අංගයක් ලෙස පැවතීම නිසා ළමයින් සහ වැඩිහිටි පරම්පරාව අතර සම්බන්ධතා අඛන්ඩ ගොඩනැගීමටත් පිටුවහලක් විය. සමාජ වැඩ භාවිතය මඟින් සමාජය තුළ පරිවර්තනීය

වෙනස්කම් සිදුකරමින් ප්‍රගතිශීලී දිශාවකට යොමු කිරීමට ප්‍රබල හැකියාවක් ඇත. ආබාධිත ප්‍රජාව වැනි සමාජ අපහරණයට ලක් වූ කණ්ඩායම් ජීවන අත්දැකීම් කතන්දර මගින් සමාජගත කිරීම සමාජය වෙනස්කිරීමේ පහසු මෙවලමක් ලෙස හඳුනාගත හැකිය.

කතන්දර පැවසීම සහ සවන් දීම අපගේ මනෝභාවයන් හා ස්නායු පද්ධතියට සම්බන්ධ වේ. කතන්දර බැහැර කිරීම හා හානි කිරීම සඳහා ඇතැම් විට භාවිතා කර ඇතත්, චිකිත්සක සන්දර්භයක් තුළ භාවිතා කරන විට ඒවා සුව කිරීමට හා පරිවර්තනය කිරීමට බලය ඇත. හොඳ කතාවකට සම්බන්ධතාවය සහ තීක්ෂණ බුද්ධිය පෝෂණය කිරීම, සුව කිරීම හෝ සවිබලගැන්වීමේ රූපක ගෙන ඒමට සහ සේවාදායකයෙකුගේ ඔරොත්තු දීමේ හැකියාව, පරිකල්පනය සහ නිර්මාණශීලීත්වය සක්‍රිය කළ හැකිය. කතන්දරයක් රචනය කිරීමෙන් සැබෑ අත්දැකීම් සමඟ සේවාදායකයාගේ පමණක් නොව සමාජයේ ද ඉදිරි දර්ශනය වෙනස් කළ හැකි අතර නව සිතීමේ හා දැකීමේ මාර්ග විවෘත කළ හැකිය (Yashinsky, 2017). කතන්දර බහුවිධ හා බහුකාර්ය විය හැකි අතර, චරිතයක් කළ දේ පමණක් නොව, ඔවුන් සිතූ හා දැනුණු දේ, ඔවුන්ගේ ශරීර තුළ සිදුවෙමින් පවතින දේ සහ ඔවුන්ගේ හැසිරීම් රටා වලින් ද බොහෝ දේ පෙන්විය හැකිය (Janssen, 2013).

**ඉසබෙලා කෘතිය සමාජ වැඩ භාවිතයට ඇති අදාළත්වය**

සමාජ වැඩ වෘත්තීය කලාව හා විද්‍යාව අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ සාකච්ඡාවේ දී සමාජ වැඩ කලාව හා විද්‍යාව සම්බන්ධ කරන පාලම ලෙස ප්‍රායෝගික පුහුණුව සඳහා භාවිතා කිරීමට පෙන්වා දෙයි (Samson, 2014). මෙම සාකච්ඡාව පිළිබිඹු කරමින් ගුඩ්ලේ දක්වන්නේ සමාජ වැඩ භාවිතයේ කලාවේ හා විද්‍යාවේ සම්මිශ්‍රණය සමාජ වැඩ වෘත්තීයේ සුවිශේෂීභාවය ආරක්ෂා වන බවයි. මෙමගින් අපට මතක් කර දෙන්නේ සමාජ වැඩ කටයුතු හා විද්‍යාව සම්බන්ධයෙන් ඇති වටිනාකමයි (Grade & Kinnala 2014;Samson, 2014; Goodley, 2014 උපුටා ගනු ලැබුවේ Janssen, 2013).

සමාජ වැඩ වෘත්තීය හඳුන්වා ගන්නේ විද්‍යාව හෝ කලාව යන ද්විත්වයේ සම්මිශ්‍රණයකිනි. මෙම අදහස නිසැකවම ප්‍රබල අදහසක් වන්නේ න්‍යායාත් ආකෘතීන් සහ සමාජ වැඩ වල යෙදීම් සම්මිශ්‍රණය වී මෙම වෘත්තීය භාවිතය ගොඩනැගී ඇති බවයි.බොහෝ විට සමාජ වැඩ සංවර්ධනයේ දිශාවට මෙම සම්මිශ්‍රණය ප්‍රබල ලෙස බලපානු ලබයි. කතන්දරයේ තාක්ෂණික කුසලතා කෙරෙහි අවධානය යොමු කරන විට මූලික කුසලතා ශිල්ප ක්‍රම සම්ප්‍රේශණය කර ගැනීම සඳහා මෙවැනි ශිල්ප ක්‍රම භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

සමාජ වැඩ භාවිතයෙහි දී සමාජ ගැටළු මූලික වන නිසා ගැටළුවට මැදිහත්වීමක් සහ විසඳුමක් සොයා ගත යුතු වේ. යථාර්ථවාදී ආකාරයකින් ගැටළුවේ ගැඹුර ස්පර්ශ කළ විට මතුවන විසඳන මාර්ග පිළිබඳව සොයා බැලිය යුතුය. සමාජ වැඩ වෘත්තීය අනාගතයට ශක්තිමත් පදනමක් මෙමගින් සපයනු ලැබේ.තත්වය වෙනස් වන්නේ මෙවැනි ආකාරයේ ප්‍රවේශයක් අනුගමනය කිරීමෙන් පමණි.

"අපගේ ජීවිත නිරන්තරයන් ආඛ්‍යානය හා බැඳී පවතී. අප පවසන හා අසන කතන්දර, අප සිහින දකින හෝ සිතන හෝ පැවසීමට කැමති කතන්දර, මේ සියල්ලම අප විසින්ම

විස්තර කරන අපගේම ජිවිත කතාවේ ප්‍රතිනිර්මාණය වේ " (White & Epston, 1990). ඉසබෙලා කෘතිය පිළිබඳව අවධානය යොමු කිරීමේ දී දක්නට ලැබෙන්නෙ ද් ආබාධිතභාවය සම්බන්ධ අත්දැකීම් සහිත දැරිවියක් ඇය විඳි ජීවන අත්දැකීම් විස්තර කිරීමක් වුව ද ආබාධ සහිත ප්‍රජාවන්ට සමාජයෙන් සිදුවන සමාජ අපහරණය පිළිබඳ තවත් කථා වල ප්‍රතිනිර්මාණයක් ද වෙයි. එම අත්දැකීමට සමාන අත්දැකීම් ඕන තරම් සමාජයෙන් සොයා ගත හැක.ආබාධ සහිත දරුවෙකු පවුලක ඉපදීම සමග දෙමාපියන් සහෝදර සහෝදරියන්ගෙන් විවිධ ස්වරූපයෙන් සිදුවන කායික මානසික හිංසනයට ලක්වන ආකාරයත් එම දැරිවිය පවුල තුල ඒම තත්ත්වය වෙනස් කිරීමට දරන රැඩිකල් උත්සාහයක් පිළිබඳව මෙම කථාවේ අනුභූතිය වෙයි. එම තත්ත්වය වෙනස් කිරීමේ තනිව අරගලයක නිරතවීමේ සක්‍යතාවයක් ඇති මෙම දැරිවිය ගන්නා උත්සාහය මෙහිදී දක්නට ලැබේ. එය අපූරු ළමා කථාවක් වන්නේ සාමාන්‍ය සමාජය විසින් සිදුකරන වැරදි වන නොසළකා හැරීම්, සමච්චල් කිරීම, අවතක්සේරුකරීම්, පිළිකුලට ලක් කිරීම් සහ ඔවුන් කෙරෙහි ගොඩනගා ඇති ඍණාත්මක මතවාද වලට අදාළව කෘතියෙහි කතා නායිකාව වන ඉසබෙලාගේ අත්දැකීම් ගොඩනගා ඇත්තේ පාඨකයාගේ ජීවිත පරිඥාණය ගොඩනැගීමට සමත්වන ආකාරයෙනි. විවිධ මට්ටමේ දී සාමාන්‍ය සමාජය විසින් සිදුකරන හිතාමතා හෝ නොහිතා හෝ සිදුකරන ඍණාත්මක අත්දැකීම් සමග ආවර්ජනය කරන්නට, ප්‍රශ්න කරන්නන්ට, සමාන්‍ය පාඨකයින්ට ද වෘත්තිකයින්ට ද ගමන් කල යුතු දිශානතිය පිළිබඳ අවධානය යොමු කිරීමට කෘතිය මඟින් අවස්ථාව උදා කරනු ලබයි .

මෙම කෘතිය පරිවර්තනය කිරිමේ දී කතුවරිය දක්වන අදහස නම් මා කියවා ඇති බොහෝ ළමා ග්‍රන්ථ අතර උපදේශනාත්මක ළමා ග්‍රන්ථ බොහෝ ඇතත් ආබාධිභාවය හා බැඳුණු ගැටළු පිළිබඳව ඉතා සියුම් අයුරින් ළමා මනසට කා වැද්දීමට සමත් මෙවැනි ග්‍රන්ථයක් මට ඇසුරු කිරීමට ලැබී නැති බවයි (හේරත්, 2018).ආබාධසහිත ප්‍රජාව ආශ්‍රිතව මෑත කාලයේ ශ්‍රී ලංකාව තුල මතු වූ සාකච්ඡාවේ උද්යෝගීමත්භාවය නිසාත් ක්ෂුද්‍ර සහ සාර්ව මට්ටමේ මැදිහත් වීමේ දී ඒ ක්ෂේත්‍රව වැඩ කරන විවිධ පාර්ශවලින් අවධානයට ලක්කළ යුතු කරුණු රැසක් මෙම කෘතියෙන් අවධාරණයට ලක් කරනු ලැබේ.

කෘතිය පිළිබඳ මෙකී සංදර්භය තුල කෘතියෙහි කථා සාරය දැක්වුවහොත රජ පවුලක ගොත ගන කුමරියගේ ඇගේ සහෝදර සහෝදරියන් සමඟ ජිවත්වීමේ දී ඇයට සිදුවන කායික මානසික හිංසනය මෙන්ම නොසලකා හැරීම් පිළිබඳ අත්දැකීමකි. ළමා කථා ආරම්භ වන ආකාරයටම ආරම්භ වී ඇත.

*"එකමත් එක කාලයක විශාල මාළිගාවක් රජකෙනෙකුයි රැජිනකුයි වාසය කළා. එයාලට පුතාලා දෙදෙනෙක් සහ දුවලා තුන් දෙනෙක් හිටියා. වැඩිමල් කුමාරිකාව එව්ලිනා තමයි හැම වෙලේම තීරණ ගත්තේ. එයාට පස්සේ දඟකාර නිවන්නු දෙන්නා ෆිලිප් යාකොබ් නිවන්නු දෙන්නා කටකාර ලුයිසා කුමාරිකාව අන්තිමට ඉපදුනේ නිශ්ශබ්ද කුමරී ඉසබෙලා."*

කථා නායිකාව වන ඉසබෙලා කුමරියගේ ජීවිත අත්දැකීම් වැදගත් වන්නේ ඇයි? ඉසබෙලා කුමරිය නිශ්ශබ්ද කුමරිය වුණේ ඇයි? එය ඇගේ උත්පත්තියෙන් ගෙනා නිශ්ශබ්දතාවය ද නොවන තත්වයක් බව කෘතියේ සමස්ත කතාව දෙස අවධානය කිරීමේ දී විශද වේ.

විශේෂයෙන් ඇගේ සහෝදර පිරිස අවවාද කලා ගොත ගහන්නේ නැතුව කථා කරන්න කියලා.

*"වචන හරියට ශබ්ද කරන්න බැරි වෙනකොට ඉසබෙලාගේ වැරදි කිව්වා. ඒ නිසා දවසින් දවස ඉසබෙලා නිශ්ශබ්ද කුමාරිකාව වුණා."*

සත්‍යය වශයෙන්ම මෙයින් දෙන ගැඹුරු පණිවිඩය කුමක් ද ආබාධිතව බව යන්න පුද්ගලයාගේ නිර්මාණයක් නොව සමාජය විසින් නිර්මාණය කරන ලද්දක් බවයි. එක් ප්‍රබල සිද්ධියක් මුල්වෙමින්, යථාව නිරූපණය කරමින් ඉදිරිපත් කිරීම පාඨකයාට නව දැනුමක් නිෂ්පාදනය කිරීම ඉසබෙලා කෘතියෙහි සුවිශේෂත්වය වේ.

බොහෝ විට සෙල්ලම් කිරීමේ දී ඇයව ඉවත් කරන්නේ ඔයාට බෑ නාට්‍යයක රඟපාන්න ඔයාට හරියට දෙයක් කරන්න බැරි බව දැක්වීමෙනි. අනෙක් සහෝදර පිරිසගේ පිළිතුර වූයේ ඔයා හරියට කියන්න දෙයක් ඉගෙන ගන්නකම් ඔයාට අපිත් එක්ක සෙල්ලම් කරන්න බැරි බවයි.

"මෙවැනි අවස්ථා ගණනාවකට ඉසබෙලාට අත්වුණේ අඬන්න. හොඳටෝම අඬන්න. මෙවැනි සැඟවුණු අත්දැකීම් කෙතරම් ඔවුන්ගේ ජීවන අත්දැකීම් වලට එකතු වනවාද? කථන ආබාධයකින් පෙළෙන ඉසබෙලා ඇය වචන උච්චාරණය කරන ආකාරය "ඒ .......ඒ......ඒ.......එතකොට ම.....මම කවුද?"
"ම.....ම අ අ අ ආසයි හොඳ සු....සු....සු.....ඉසබෙලාට බැරිවුණා සුරංගනාවී" කියාගන්න."

සමාජ වැඩ වෘත්තිකයින් ඒ සඳහා පුහුණුවන්නන් ලෙස මෙවැනි අත්දැකීම් නිරන්තරයෙන් සමාජ වැඩ කරන ක්ෂේත්‍රයන් තුල අසන්නට ලැබේ. සිදුවීම් තර්කානුකූලව හේතුඵල සම්බන්ධතාවයකින් හා මනා ඒකාබද්ධතාවයක් යුක්තව ඉදිරිපත් කිරීමත් කතන්දරයක තවත් ජීව ගුණාංගයක් වේ.

සහෝදර කණ්ඩායමෙන් ඇයට ලැබෙන උසුළු විසුළු කිරීම්, පිළිකුල් සහගත බව, සමාජයෙන් ප්‍රතික්ෂේප කිරීම් දිගින් දිගටම සිදුවන තත්ත්වයයි. සෑම දිනකම ඔවුන්ගේ එදිනෙදා ජීවිත අත්දැකීම් වලට මෙවැනි සෘණාත්මක අත්දැකීම් එකතු වන විට ඔවුන්ගේ ජීවිත ස්වාධීන වීමට සෘජුව බලපානු ලබයි.

සමාජ වැඩ වෘත්තිකයිනගේ එක් භූමිකාවක් වන උපදේශනය කිරීමේ සන්දර්භය තුල, කතන්දර කීම භාවිත කරන විට ඔවුන්ගේ සේවාදායකයින්ගේ ඉතිහාසය, සබඳතා සහ අරගල ගැන සවිඥාණික හා සිහිසුන්ව ගෙන එන කථා සේවාදායකයෙකුගෙන් බලාපොරොත්තු සහ මානසික වර්ධනයට වඩා හොඳින් සහාය වන නව අඛ්‍යාන නිර්මාණය වන්නේ කෙසේද යන්න කතන්දර තුලින් පෙන්වා දෙයි (Yashinsky, 2017). ඉසබෙලාගේ චරිතය පෞද්ගලිකව ලබන අත්දැකීම් පොදු අත්දැකීම් බවට පත් කිරීමේ ප්‍රබල හැකියාවත් කෘතිය මගින් ගොඩනගන ආබාධිත ප්‍රජාවගේ වෙනස පිළිගැනීම පිළිබඳ පණිවිඩයත් කෘතිය මගින් වඩා හොඳින් පෙන්වා දෙයි.

පශ්චාත් උපාධි පාඨමාලාවට පර්යේෂිකාව විසින් සිදුකරනු ලැබූ පර්යේෂණය වූයේ දිල්ලි විශ්ව විද්‍යාලයේ දී දෘශ්‍යාබාධිත ස්ත්‍රී විද්‍යාර්ථයින් සමාජ සම්බන්ධතා පැවැත්වීමේ දී මුහුණ දීමට සිදුවන සමාජ අපහරණය පිළිබඳවවියි. ඉසබෙලා කෘතිය සහ ඇගේ සැබෑ අත්දැකීම් සහ මෙම පර්යේෂණ අත්දැකීම් සමාන වන විට දිල්ලි විශ්ව විද්‍යාලයේ දෘශ්‍යාබාධිත ස්ත්‍රී විද්‍යාර්ථයින්ගේ ජීවන අත්දැකීම් පවුල අධ්‍යාපනය ඇතුළු අනෙකුත් සංස්ථා සමඟ කටයුතු කිරීමේ දී මහා පොදු සාධකයක් ඇති බව දක්නට ලැබේ.ඔවුන්ගේ ජීවිතයේ විවිධ අවස්ථා වලදී සිදුවන ආබාධ ක්‍රියාකාරකම් සීමා සහභාගීත්වයට ඇති අවහිරතාවයන් දක්නට ලැබේ. පුද්ගලයෙකු විසින් විවිධ ජීවන තත්ත්වයන්වලට සම්බන්ධවීමේ දී ලබන අත්දැකීම් වන්නේ සහභාගීත්වයට ඇති දුෂ්කරතාවයන්ය.එය ආබාධ සහිත කතිකාව තුල නිරන්තරයෙන් සාකච්ඡාවට භාජනය වන මාතෘකාවක් ලෙස පුද්ගලයාගේ ශරීරයේ හැඩහුරුකම සහ අන්තර්ක්‍රියා මඟින් පරාවර්තනය වන්නේ ඔහු හෝ ඇය ජීවත්වන සමාජයේ හැඩහුරුකමයි.

නැවතත් ඉසබෙලා කුමරිය දෙස අවධානය යොමු කරන විට ඇගේ දුක ඇය කියන්නට පෙළඹුනේ ගහ කොළට සතුන්ට. මෙවැනි සැගවුණු අත්දැකීම් කොතරම් ඔවුන්ගේ ජීවන අත්දැකීම් වලට ඒකතු වනවාද ? ඔවුන්ගේ ජීවිතයේ එදිනෙදා ජීවිත අත්දැකීම් වලට සම්බන්ධ වන මෙම අත්දැකීම් ඔවුන්ගේ ස්වීයත්වය ස්වයං අනන්‍යතාවය සහ පෞරුෂය ගොඩනැගීමට ඉතාමත් දැඩිව බලපානු ලබයි. කෝකිලයාගේ ආගමනයත් සමගම කථාව තව කෙනෙකු සමඟ බෙදා ගැනීමෙන් පුද්ගල ජීවිතය සිදු කරන බලපෑම අවධානය යොමු කළ හැකිය . කතන්දරවලට අපගේ හාස්‍යය පිළිබඳ හැඟීම ශක්තීන් සහ නව විසඳුම් අනාවරණය කර ගත හැකි අතර ලැජ්ජාව,හුදකලාව පිළිබඳ හැඟීම් අඩු කරන ආකාරවලින් අත්දැකීම් සාමාන්‍යකරණය කළ හැකිය.ඒවාට අපගේ ඉදිරි දර්ශනය වැඩි දියුණු කළ හැකිය. කරදරකාරී සිතුවිලි සහ චිත්තවේගයන්ගේ බර ලිහිල් කළ හැකිය. ධනාත්මක මතකයන් ජනිත කළ හැකිය. නව බලාපොරොත්තු ඇති කළ හැකිය (Jessen, 2013). ඉසබෙලා කෝකිලයාගෙන් උදව් ලබා ගැනීමත් කරදර කාරී සිතුවිලි සහ චිත්තවේගයන් බැහැර කරගන්නා ආකාරය මෙමඟින් පැහැදිලි වේ.ඇය වචන උච්ඡාරණය කරන ආකාරය පිළිබදව සහෝදර කණ්ඩායමෙන් ඇයට ලැබෙන උසුළු විසුළු කිරීම් පිළිකුල් සහගත බව සමාජයෙන් ප්‍රතික්ෂේප කිරීම් දිගින් දිගටම සිදුවන තත්ත්වයයි.මෙම කෘතියෙහි සමාජ වැඩ වෘත්තිකයෙකුට එසේත් නැත්නම් එම වෘත්තිය සදා පුහුණු වන්නෙකුට දෙන ඉගෙන ගැනීම් අපූරු වන්නේ ඉසබෙලාගේ දුක අසාගෙන ඇයව එම පීඩිත ජීවිතයෙන් මුදවා ගැනීමට බලගන්වන්නේ කෝකිලයාගේ චරිතයයි. සමාජ වැඩ වෘත්තීය භාවිතය සහ න්‍යායාත්මක දහරාවන් යොදාගනිමින් ගැටළුවකට ආමන්ත්‍රණය කිරීමේ දී මෙම කෝකිලයාගේ සම්ප්‍රප්තිය කේන්ද්‍රීය වැදගත්කමක් උසුලනු ලබයි.

**සමාජ වැඩ න්‍යායන්, ශිල්පීය කුසලතා සහ ආකල්ප**

සමාජ වැඩ වෘත්තීය භාවිතයට අදාළ දැනුම කුසලතා ආකල්ප යන කුලුණු තුනේ වැදගත්කම මෙම කෘතියෙහි කෝකිලයාගේ චරිතය මඟින් ගෙන හැර දක්වනු ලබයි. කෝකිලයා ඉසබෙලාගේ ගැටළුව අවබෝධ කරගැනීමේ දී දැක්වූ පරිචය සහ ගැටළු නිරාකරණයේ දී දැක්වූ හැකියාව කෝකිලයාගේ චරිත ලක්ෂණ කුසලතාවයන් සහ ආකල්පමය වශයෙන් දැක්වූ සුවිශේෂීතාවය මෙම කෘතිය පරිශීලනය කිරීමේ දී දක්නට

ලැබේ. ආබාධ සහිත ප්‍රජාව සමඟ කටයුතු කිරීමේ දී බොහෝ විට පුණ්‍ය පරමාර්ථ (Charity Model) මූලික කරගෙන කටයුතු කරත් මෙම කෘතියෙහි ආබාධිත ප්‍රජාව ආමන්ත්‍රණය කිරීම සඳහා කතුවරිය විසින් සාම්ප්‍රදායික ආකෘති අභිබවා ආබාධිතභාවය තහවුරුකිරීමේ ආකෘතිය, පුද්ගල නිදහස, සහභාගීත්වය, අන්තර්ග්‍රහණය, විවිධත්වයට ආමන්ත්‍රණය කිරීම, සවිබලගැන්වීම, ආබාධිතභාවය සම්බන්ධ නීතිමය ආකෘතිය පිළිබඳ දිශානති පිළිබඳව මෙම කෘතියේ අන්තර්ගත වී ඇත.

අප නොමැතිව අප ගැන කිසිවක් නැත: සවිබල ගැන්වීම (Nothing About Us Without Us) යන ප්‍රතිපත්තියෙන් ඉදිරිපත් කිරීමට උත්සාහ ගත්තේ, එම ප්‍රතිපත්තියෙන් බලපෑමට ලක්වූ කණ්ඩායමේ සාමාජිකයින්ගේ පූර්ණ හා සෘජු සහභාගීත්වයෙන් තොරව කිසිදු නියෝජිතයෙකු විසින් කිසිදු ප්‍රතිපත්තියක් තීරණය නොකළ යුතුය යන අදහස සන්නිවේදනය කිරීම සඳහා භාවිත කරන සටන් පාඨයකි (Oliver, 1996). ශ්‍රී ලංකාව හා ස්ලෝවේනියා ඇතුළු බොහෝ රටවල ඉසබෙලා වැනි දරුවන්ට සිදුවන පරිහාසයට හා සමච්චලයට ලකම්ම අප්‍රකට සිද්ධියක් නොවන බවත් ඔවුන් පිළිබඳව තීන්දු තීරණ ගැනීමේ දී ඔවුන් වෙත නැඹුරු වූ ප්‍රවේශයක් අනුගමනය කළ යුතු බවත් මෙම කෘතිය මඟින් අනාවරණය කෙරේ.

සමාජය තුල ඉසබෙලා වැනි දරුවන්ට සිදුවන කථනය පිළිබඳ බාධාකාරී තත්ත්වය පෞද්ගලික කරුණක් බවට පත්වන අතර සමාජය තුල ඇති විවිධාකාර වෙනස්කම් ප්‍රතික්ෂේප වීමද සාමාන්‍ය තත්ත්වයක් බවට පත්වී පොදුවේ පිළිගැනීමට ද ලක් වේ. එමගින් මෙවැනි දරුවන්ට නිරන්තරයෙන් අසන්තෝෂය ශෝචනීයත්වය අභාග්‍යය හා කුරිරු දෛවය පිළිබද සංකේතයක් ලෙස සැලකෙයි. මෙමඟින් ගෙඩනැගෙන පීඩාකාරී තත්වය තුල ඔවුන්ට අමුතු පීඩාකාරී සංස්කෘතියක් ගොඩනැගෙනු ලැබේ. පීඩාකාරී විරෝධි ආකෘතිය (Anti oppresseive model) කොකිලයා සහ ඉසබෙලා මුණ ගැසීම රූපෝව ගොඩනගා ගැනීම කෝකිලයාගේ මැදිහත්වීමේ ස්වරූපය සමාජ වැඩකරුවන් වන අපිට ද නව ප්‍රවේශයක් නව චින්තනයක් වෙත අපව කැදවාගෙන යනු ලබයි.

ගොත ගසන දරුවා අනෙක් අයගේ අවධානයට ලක් වන්නේ වෙනස් කෙනෙකු ලෙස ය. මෙහි දී ‘වෙනස’ යන්නෙන් අදහස් වන්නේ මානව විවිධත්වය තුල පුද්ගලයන් සමානය යන අර්ථය නොව පරමාදර්ශීය වශයෙන් ගොඩනැඟී ඇති සමානත්වය පිළිබඳ ප්‍රතිරූපය තුල ගොත ගසන දරුවා අනෙකෙකු බවට පත්වන්නේය යන්නයි. යම් පුද්ගලයෙකු වෙනස් කෙනෙකු ලෙස සැලකෙනවිට ඔහු හෝ ඇය තවදුරටත් පිළිගැනීමකට ලක් නොවන අතර අවධානයෙන් ගිලිහුණු අයෙකු බවට පත්වේ. ඇසීමේ සහ පෙනීමේ ඌනතාවකින් යුක්ත දරුවා ඒ අනුව අසන්තෝෂය ශෝචනීයත්වය අභාග්‍යය හා කුරිරු දෛවය පිළිබඳ සංකේතයක් ලෙස සැලකෙයි. අන්‍යභාවය සමාජ අසමානතා වැනි සමාජ වෙනස්කම් නිර්මාණය කෙරෙන සමාජ ක්‍රියවලිය වන්නේ මෙම ක්‍රියාවලියයි (ෂර්විෂෙක් 2018 උපුටා ගනු ලැබුයේ හේරත් ගෙනි).

ගොත ගසන දරුවන් වෙනස් යැයි දරුවා නිතරම අසන විට අප සහ ඔවුන් අතර සමාජ වෙනසක් හා සමාජ දුරස්ථභාවයක් ගොඩනැගෙන අතර සංස්කෘතික අමුතුබව ප්‍රතික්ෂේප කිරීම හෝ අසාමාන්‍යතාවට ද්වේශ කිරීම යන හැඟීම් වැඩෙන්නට පටන් ගනියි. මෙම

මනෝවිද්‍යාත්මක ක්‍රියාවලියේ දී වෙනස් ලෙස සැලකෙන දරුවන් නිෂේදනාත්මක සංසන්දනයට භාජනය වෙයි. සාමාන්‍ය සහ වෙනස් බව අතර සමාජීය වශයෙන් ගොඩනගන ලද සමාජ පරතරය මෙම ක්‍රියාවලිය තුල දී වඩාත් තහවුරු වෙයි.

කතන්දර පැවසීම සහ සවන් දීම අපගේ මනෝභාවයන් හා ස්නායු පද්ධතියට සම්බන්ධ වේ. කතන්දර බැහැර කිරීම හා හානි කිරීම සඳහා ඇතැම් විට භාවිත කර ඇතත් චිකිත්සක සන්දර්භයක් තුල භාවිත කරන විට ඒවා සුව කිරීමට හා පරිවර්තනය කිරීමට බලය ඇත. හොඳ කතාවකට සම්බන්ධතාවය සහ තීක්ෂණ බුද්ධිය පෝෂණය කිරීම සුව කිරීම හෝ සව්බල ගැන්වීමේ රූපක ගෙන ඒමට සහ සේවාදායකයෙකුගේ ඔරොත්තු දීමේ හැකියාව පරිකල්පනය සහ නිර්මාණශීලිත්වය සක්‍රීය කළ හැකිය. කතන්දරයක් නිවැරදි යතුරු පුවරුමට පහර දෙන විට එය සේවාදායකයාගේ ඉදිරි දර්ශයනය වෙනස් කළ හැකි අතර නව සිතීමේ හා දැකීමේ මාර්ග විවෘත කළ හැකිය https://www.socialworktoday.com/archive/exc-0519-4.shtml

<u>මෙම කෘතියෙහි එන ඉසබෙලාගේ ජීවන අත්දැකීම් සමාජීය වශයෙන් නිර්මාණය වී ඇති අතර ආබාධ සහිත බව පිළිබඳ සමාජීය මතවාද ඔස්සේ ඉගෙනුම් ක්‍රියාවලිය සහ දරුවා ජීවත්වන පරිසරය මගින් දරුවා තුළට ඇතුළු කරන ලද ඒවා වෙයි. මිනිසුන් අතර බහුල වශයෙන් දක්නට ඇති සුවිශේෂතා වසන් කිරීමටත් ඒ සමගම වෙනස්කම් අවධාරණය කරමින් පොදු ලක්ෂණ නොසලකා හැරීමටත් යොමු වන බව කෘතියෙන් පෙන්වා දෙන අතර සමාජයක් තුල පරිවර්තනීය වෙනසක් අති කිරීමට මෙවැනි කතන්දර සමාජගත කිරීමෙන් පුද්ගලයන් ප්‍රගතිශීලි වෙනසකට යොමු කළ හැකිය.</u>

**සමාජ වැඩ මැදිහත්වීම සහ කෝකිලයාගේ භූමිකාව**

කෝකිලයා ගීත ගායනා කරන අයුරුත් හැම කෝකිලයෙකුම එකම විදිහට ගීත ගායනා කරන්නේ තම තමන්ගේ විදිහට බවත් දක්වමින් ඉසබෙලාගේ සැබෑ ගැටළුව ඇයටම තේරුම් ගැනීමට සැලස්සුවා. සමාජ වැඩ භාවිතයේ දී සේවා භාවිතාකරන්නට ස්වයං අවබෝධය ලබා දීම සේවා භාවිතාකරන්නාගේ දිශානතිය වෙනස් කිරීමට ප්‍රබල බලපෑමක් කරනු ලැබේ.ඒ සඳහා කෝකිලයා ලබා දෙන මෙවලම වන්නේ විවිධ ආකාරයෙන් ගීත ගායනයෙන් හඩ උස් පහත් කිරීමෙන් සාමාන්‍ය ලෙස ගැයීමෙන් ගීතයට ඇතිවන මිහිරිබවත් ඒ තුලින් ලෝකයට ලබා දෙන සෞන්දර්යත් වටහා ගැනීමට ඇයට සැලැස්වීමයි.

සමාජ වැඩ යනු සංකීර්ණ විෂයක් වන අතර අප හමුවේ ඇත්තේ ද සංකීර්ණ ගැටළුවයි. මෙම සංකීර්ණතාවයන් සරල කර ගැනීම සඳහා සමාජ වැඩ විෂයෙහි ඇති විද්‍යාත්මක භාවිතයත් කලාවත් ඒකට සම්මිශ්‍රණය විය යුතුයි. ඒ සඳහා බොහෝවිට මගේ පංති කාමර ඉගැන්වීමේ දී පවා චිත්‍රපටි, විවිධ සාහිත්‍ය කෘති, ගීතය වැනි මාධ්‍ය යොදා ගනු ලබන්නේ හුදු දේශගුණයක් සිදු කරනවාට වඩා ගැටළු වල තිබෙන සංකීර්ණතා ක්ෂේත්‍ර අත්දැකීම් වලින්ම සමාජ වෘත්තිකයින්ට අවාරණය නොවේ. මෙවැනි මෙවලම් භාවිතා කිරීමෙන් සමාජ වැඩ භාවිතා කරන්නන්ගේ ජීවිතය ආවර්ජනය නිරත කරවීම පහසු කෙරේ (ජයසේන, 2020).

ඉසබෙලා වැනි චරිත ඔවුන්ගේ ජීවිත තීරණය කරන බලය, පීඩාව සහ බල රහිතභාවය යන සංකීර්ණ කාරණා සමඟ සැසඳීමෙ පටන් ගන්නා ප්‍රවේශයක් සපයනු ලැබේ. මෙම මූලධර්මය පිළිබඳ අවබෝධයක් මඟින් යම් තත්වයක් තක්සේරු කිරීම සහ පවත්නා තත්ත්වය වෙන්ස කිරීම සඳහා අවශය වන ක්‍රියාවෙහි ස්වභාවය අතර පවතින සම්බන්ධතාවයේ මූලින පරිවර්තනයන් සඳහා සමාජ වැඩ වෘත්තිකයින්ව පොළඹවනු ලබයි.

කෝකිලයාගේ මෙම ප්‍රවේශය සමාජය විසින් ගොඩනඟා ඇති ඒකාකෘති ආකෘතියට අකුල් පහරක් එල්ල කරන අතර කථනයේ විවිධ ස්වරූප අනෙකා තේරුම් ගැනීමට යොදා ගැනීමත් කථනයේ ආවේණික අනන්‍යතාවයන් ලෝකය ලස්සන කිරීමට යොදා ගන්නා ආකාරය පිළිබදවත් මෙමඟින් කදිමට නිරූපණය කරනු ලබයි. කෝකිලයා අන්තිමවරට නාද කරලා අනෙක් කුරුල්ලන් එක්ක ලස්සන උණුසුම් තැනක් හොයාගෙන ඈතට යන්න කලින් ඔයා එක්ක දැනගන්න ඔයා කතා කරන විදි වැදගත් නැත වැදගත් ඔයා කියන දේයි ඒක මතක තියා ගන්න කියලා ඊළඟ වසන්තයේ දී හමුවෙමු කියලා ඈතට ඉගිලිලා ගියා. මෙමඟින් ඉසබෙලා ඇගේ ජීවිතය පිළිබඳව ප්‍රත්‍යවලෝකනයක නිරත වීමටත් ගැටළුවක් විසඳා ගැනීමේ මාර්ගය ඇත්තේ අන් කිසිවක් ළග නොව තමන් තුලම බවත් ස්වං ඥාණය ලබා ගැනීම තුලින් ස්වයං අවබෝධය ලබා ගැනීමටත් මනා පිටුවහලක් විය. කෝකිලයා විසින් උද්දීපනය කල ස්වයං ඤාණය ඉසබෙලා යොදා ගත්තේ කදිම උපායාමාර්ගයකිනි සමඟ ඇගේ උපන්දිනය දීය. ඇය පිය රජු සහ මව් බිසවගෙන් දැඩි ඉල්ලීමක් කලා. ඇගේ උපන් දිනයේ ඇගේ පැතුම වූයේ ඇගේ සහෝදර සහෝදරියන් ද ඇය ගොත ගසන ආකාරයට ගොත ගසන්නට ආරාධනා කළා. පිය රජතුමා එම ඉල්ලීම කඩකරන්නේ නැතුව ක්‍රියාත්මක කරන්න කැමති වුණා. එදිනෙදා ජීවිතයේ බොහෝ වෙලාවට අනෙකාගේ අවශ්‍යතා සිතුම් පැතුම් දැනෙන්නේ නැත්තේ සැබවින්ම අපි අනෙකාගේ ප්‍රවේශයෙන් කොදකින නිසාය . අනෙක් අය අයට අනුකරණය කිරීම මඟින් ගොත ගසන කෙනෙක් වචන උච්චාරණය කරන ආකාරයේ සුවිශේෂත්වය ඇතැම් අකුරු දීර්සව ශබ්ච වන අතර ඇතැම් අකුරු උච්චාරණය කරනු ලබයි.

මෙම පොතේ කතුවරිය එය දක්වන්නේ ගොත භාවයේ ප්‍රමාණය මත මෙන්ම එක් එක් භාෂාවේ භාවිත වන හා අවධාරණය වන අක්ෂර අනුව ද වෙනස් විය හැකිය. එම සුවිශේෂී ස්වභාවය කතුවරිය ගැඹුරින් අවබෝධ කරගෙන කෘතියේ මුල් කතුවරිය වන බෙයටා ඇකර්මන්ගේ ජීවන අත්දැකීම් සිංහල පාඨකයා අතරට ගෙන එන්නට මැනවින් උත්සාහ කර ඇත.ගොත ගසන පුද්ගලයෙකු ලෝකයට විවෘත වන්නේ ඇගේ භාෂා භාවිතයේ ඇති සුවිශේෂීත්වය සිංහල භාෂාවට යොදා ගැනීමේ දී නැවත නැවත උච්චාරණය වීම ද කුමන ආකාරය ද යන්නත් මෙම වෙනස් තත්ත්වය තේරුම් ගැනීමට ශිල්පීය කුසලතා ප්‍රගුණ කිරීම තුලින් පහසුවෙන් ගොත ගසන පුද්ගලයෙකු සමග ගණුදෙණු කළ හැකි බවත් පොත පරිශීලනයෙන් ඔබට ලැබෙන පණිවිඩය වේ (හේරත්, 2018).

සමාජයේ මුල් බැසගෙන ඇති අගතීන් මිනිසුන්ට ඉවසිලිවන්නතව කටයුතු කිරීමෙන් වෙනස්කල හැකි බව. මිනිස්සුන්ට ඇහුම් කන් දීමට කාලයක් අවශ්‍ය බවත් එමගින් ඔවුන්ගේ සිතුවිලි සම්පූර්ණයෙන් අනෙකාට අවබෝධ කර ගත හැකි බව ඉසබෙලාගේ චරිත නිරූපණයෙන් මැනවින් දක්නට ලැබේ. මිනිසුන්ට ඉවසිලිවන්තව කටයුතු කළ හැකි

ක්‍රම කිහිපයක් ඉසබෙලා විසින් ලැයිස්තුගත කර ඇති බවත් මිනිසුන් ඉසබෙලාගේ ගොත ගැසීම පිළිබඳව කුතුහලයෙන් සිටින විට ආචාරශීලී ලෙස විමසන විට එම ප්‍රශ්නය අර්ථවත් ආකරයෙන් සන්නිවේදනය කළ හැකි බව කතන්දරය තුල අන්තර්ගත ශිල්පීය ලක්ෂණ මගින් මතු කරනු ලැබේ.මෙම කතන්දර මගින් ගෙනහැර දක්වන දිනපතාම මෙවැනි ආකාරයේ අත්දැකීම් ලබන පුද්ගලයෙකුගේ ජීවිතයේ සිදුවන ශෝකාන්තයත් ඔවුන්ගේ අපහසුතාවය පිළිබඳ විවෘත වන විට සමාජය ඔවුන් දෙස විවෘත මනසකින් නොබැලුවහොත් නරක ප්‍රතිඵල ඔවුන්ට හිමිකර දෙන බවයි. මෙවැනි සමාජ පසුබිමක ආබාධ සහිත ප්‍රජාව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම, අන්තර්ග්‍රහණය කිරීම හෝ බහිස්කරණය සහ ඨකරණය සැලකීමේ හෝ නොසලකා හැරීම් ද සමාජ නිර්මිතය තුළ ගොඩනැගුණි (Ewing, 1997, Giddens 2007 උපුටා ගනු ලැබුවේ හේරත් 2015)

මෙම කෘතිය පාර්ශව කිහිපයක් ආමන්ත්‍රණය කරන අතර දරුවන්ට මෙම ගැටළුව දෙස බලනන්ට මෙවැනි දරුවෙකුගේ දෙමාපියන්ට ප්‍රජාවට සහ ආබාධ සහිත ප්‍රජාවන් සමග වැඩ කරන සමාජ වැඩකරුවන් ඇතුළු වෘත්තිකයින්ටත් වැදගත් වන කෘතියක් ලෙස දැක්විය හැකිය. කථන-භාෂා ආබාධ/ප්‍රමාදයන්/පාසල් පසුබිමෙහි වෙනස්කම් ඇති දරුවන් සමඟ වැඩ කිරීමට අවශ්‍යය. කුඩා දරුවන් එතරම් වෙනසක් පිළිගන්නා බවක් පෙනෙන්ට තිබුණත් හිරිහැර කිරීම සම්බන්ධයෙන් ඔවුන්ට තම සම වයසේ මිතුරන්ට වඩාත්ම නපුරු විය හැකිය.පැකිලෙන ළමයින්ට හිරිහැර කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී යොදා ගත හැකි මෙවලමක් ලෙස ද දැක්විය හැකිය.

විශේෂයෙන් පාසැල්වල හිරහැර කිරීම නැවැත්වීමට හැකි හොඳම හා වඩාත්ම පැහැදිලි ක්‍රමය නම් දෙමාපියන් තම දරුවන් නිවසේ දී මව්පියන්ගේ ආකාරය වෙනස් කිරීමයි. දරුවන්, දෙමාපියන් සහ ගුරුවරුන් ගොතගැසීම පිළිබඳව දැනුවත් කිරීම ද ඉතා වැදගත් ය. හිරහැර කිරීම වැළැක්වීම සඳහා පාසලේ වැඩිහිටි අධීක්ෂණයක් ඇති බවට පාසල් සහතික විය යුතුය. ගුරුවරුන් සහ දෙමාපියන් හිරිහැර කිරීමේ හැසිරීම් පිළිබඳව දරුවන් දැනුවත් කළ යුතුය. මෙය සියලුම දරුවන්ට පාසලේ දී ආරක්ෂිත සහ සුරක්ෂිත බවක් දැනීමට ද උපකාරී වේ. ඔවුන්ගේ දෘෂ්ටිකෝණයෙන් ගොත ගැසීම පිළිබඳ වඩා හොඳ අවබෝධයක් ලබා ගැනීමට මෙවැනි ආකාරයේ මෙවලමක් යොදා ගත හැකිය.

මෙම කතන්දරය බෙදා ගැනීමෙන් කියවීම බොහෝ විට කථන ආබාධයකින් පෙළෙන අනෙක් අයගේ සෘණාත්මක අර්ථයන් සහ ප්‍රතික්‍රියා කෙරෙහි පාඨකයාගේ දෑස් විවර කිරීමට උපකාරී වේ. පංතීයේ දී ධනාත්මක ආකල්පවල වැදගත්කම සහ කථන චිකිත්සාවෙහි සාර්ථකත්වය සඳහා ඇති අවස්ථාවන් පිළිබඳ දිරිගැන්වීම්/ධනාත්මක දෘෂ්ටිය ලබා දීමට ඉඩප්‍රස්ථා උදා කරනු ලබයි.

නිශ්චිත කතාවක් අසන තුරු ඇතැම් විට මිනිසුන්ට යම් යම් අත්දැකීම් සම්බන්ධ කර ගැනීමට අපහසු වනු ඇත. වර්තමාන සමාජයේ මිනිසුන් පැහැදිලිවම නොදැන සිටින දෙයක් ගැන, ජීවිත කාලය පුරාම විහිළු කුරිරු අදහස් සහ අනුකම්පා කරමින් “ වාචික නොවන සන්නිවේදනය වචනවලට හැකි තරම් රිදවිය හැකිය” ද යන්න මෙම කෘතියෙන් පෙන්වා දෙනු ලැබේ. අනාගත පරම්පරාවක් ගොතගැසීම පිළිගැනීම හා පැකිලෙන මිනිසුන්ට ගරු කරමින් කුසලතා දියුණු විය යුතු යන අවශ්‍යතා සහ අයිතිවාසිකම්

ධනාත්මක ලෙස පිළිගැනීමට පීඩාවට පත්වීම පිළිබඳව ජනතාවට ඉගැන්වීම කථන ආබාධ පිළිබඳ නිෂේධාත්මක ආකල්ප වෙනස් කිරීමේ අරමුණින් සාමාන්‍ය ජනතාව අතර දැනුවත්භාවය ඇති කිරීම ලොව පුරා කළ යුතු වැදගත්ම ක්‍රියාවකි.

මානව ගරුත්වයට ගරු කිරීම සහ ස්වයං නිර්ණය සඳහා පුද්ගලයාට ඇති අයිතිය සමාජ වැඩ පිළිවෙල ගොඩනැඟීමේ පදනමයි (මිනාහාන්, 1987) ඉසබෙලා විසින් දැක්වූ නීති හත තුලින් මතු කරන්නේ තවත් දෙයක් තේරුම් ගැනීමට තව කෙනෙකුගේ දෘෂ්ටිකෝණයෙන් සිතිය යුතු බවයි.
ඉසබෙලාගේ නීති හත

1. කවුරු හරි ගොත ගසනවා ඇහුණොත් හිනා වෙන්න එපාග මොකද එයාට දුක හිතෙනවා
2. එයාට ඇහුම්කන් දෙන්න
3. කෙනෙක් ගොත ගසන නිසා එයාව පන්නා දමන්න එපා
4. ගොත ගසන කෙනෙක් කතා කරනකොට එයාගේ කටට වචන දෙමින් බාධා කරන්න එපා
5. ගොත ගසන කෙනා කියන්න හදන දේ මොකද්ද කියලා හිතන්න හදන්න එපාග මොකද ඔබ දන්නේ නැහැ එයාට මොකද්ද කියන්න ඕනෑ කියලා
6. කවුරු හරි ගොත ගසන කොට එයාගෙ වැරදි කියලා වැඩක් නැහැ. එයා ඊට වැඩිය ගොත ගසයි
7. මේ සෙල්ලම හැම දෙනාටම අදාළයි. ඒ නිසා හැමෝටම පුළුවන් සෙල්ලම් කරන්න

ඉසබෙලා රජගෙදරට පැනවූ නීති පිළිබඳව ගැඹුරින් විග්‍රහ කිරීමේ දී පෙන්නුම් කරන්නේ සමාජ වැඩ භාවිතයේ දී අදාළ ගැටළුවට අදාළ වන පාර්ශවයන් එකතු කර සමාජ ප්‍රතිපත්ති සම්පාදනයටත් යොමු වී ඇති බවයි. ඒ සඳහා ඇය ගත් ප්‍රවේශය රැඩිකල් වන අතර පීඩා විරෝධි මූලධර්මය මුගික් අපේක්ෂා කරන්නේ පීඩිතයින් තමන්ගේ සමාජ අනන්‍යතාවය සහ සාරධර්ම ඔවුන් අත්විඳින සමාජ ලෝකය පිළිබඳ ගැඹුරු අවබෝධයක් කෘතියෙන් අන්තර්ගත බවත් ය.

මෙම කෘතිය පාර්ශව කීහිපයක් ආමන්ත්‍රණය කරන අතර පාසැල් දරුවන්ට මෙම ගැටළුව දෙස ගැඹුරින් බලන්නට, දෙමාපියන්ට සහ පාසැල් ගුරුවරු අධ්‍යාපනඥයින් ඇතුළු ආබාධ සහිත ප්‍රජාවන් සමඟ වැඩ කරන සමාජ වැඩකරුවන්ට නිර්දේශ කළ හැකිය.කථන අපහසුතා දරුවන්ට ඉගැන්වීම අතිශයින්ම වැදගත් වන අතර අප කථා කිරීමේ දී පැකිලෙන පුද්ගලයෙකු සමඟ කතා කරන විට/ප්‍රතික්‍රියා කරන්නේ කෙසේද? ළමයින් කෙරෙහි පමණක් අවධානය යොමු නොකරන්න. දැමාපියන් සිසුන් අනාගත ගුරුවරු පෙර පාසැල් ගුරුවරුන් සමාජ සේවකයින් පාසල් මනෝ විද්‍යාඥයින් දැනුවත්භාවය ඇති කිරීමටත් මෙම කෘතිය උපකාරී වේ. සමාජය දැනුවත් කිරීම අතිශයින්ම වැදගත් වන අතර පැකිලෙන පුද්ගලයෙකු සමඟ කතා කිරීමට ප්‍රතිචාර දැක්විය යුතුයි. පාසැල් ළමයාගේ සිට දැනුවත් කිරීම සිදු කිරීමත් එවැනි අපහසුතා ඇති අය සමඟ ආරවුල් ඇති නොකර සමානාත්මතාවයෙන් කටයුතු කළ හැකි ආකාරය කියා දිය හැකිය දෙමාපියන්ට දරුවන්ට ගුරුවරු පාසැල් පරිපාලනය ඇතුළු සියලු දෙනාම දැනුවත් කිරීමට පහසු වේ

ගොතභාවයට පත්වන අයගේ ආත්ම අභිමානයට නිගා කරන්නේ නැතුව ඔවුන්ගේ ජීවිත ගොඩනැගීමට නිර්මාණශීලි ලෙස මැදිහත් වන ආකාරය මෙමගින් හඳුනාගත හැකිය.

මෙවැනි පුද්ගලයින් සමඟ කටයුතු කිරීමේ දී අනුකම්පාව නොව ඉවසීම අවශ්‍ය බවත් පුද්ගලයින්ගේ ගුණාත්මක අත්දැකීම් සහ මිනිසුන් සමඟ අන්තර්ක්‍රියා කිරීමේ දී වචන වල ඇති බලය සහ එමගින් ඇතිකරන බලපෑම ජීවිත කාලයටම ඇති කළ හැකි බව මෙම කෘතියෙන් පෙන්වා දේ. යමෙකු විසින් සිදුකරන රළු ප්‍රකාශ අමතක කිරීමට නොහැකි ද තමන් පවසන වචනවල බලය සමහරුන්ට එකම මෙහොතක අමතක විය හැකි වචන සහ තවත් අය ඔවුන්ගේ ජීවිත කාලය පුරාම ඔවුන් තුල සිරවී සිටින වචන අමතක කරති. වචන අපගේ සවයං ප්‍රතිරූපයට බලපෑම් කරති. වචන අපගේ ස්වයං ප්‍රතිරූපයට බලපෑම් කරයි. වචන අපව සවිබල ගන්වයි. ඒ අතරම වචන අපව විනාශ කර අපගේ අවසාන බලාපොරොත්තු ඉවතට ගත හැකිය. නින්දාවට අපහසුතාවයට පත්වීම ලැජ්ජාවට පත් වීම යන හැඟීම වැළැක්විය නොහැකිය.

ස්ලෝවේනියාවේ සිට බෙයටා ඇකර්මන්ගේ ජීවිත අත්දැකීම් ලෝකයේ බොහෝ ප්‍රදේශවල අදාළ වේ. සමාජ අගතීන් පිළිබඳ දෘෂ්ටියක් ලබා ගැනීම, පිටස්තරයෙකු ලෙස හැඟීම පාකර් දක්වන ආකාරයට අධ්‍යාපනය සහ රැකියාව දේශපාලනය, පෞද්ගලික ජීවිතය, කුලය, ආගම සහ සංස්කෘතිය සහ විනෝදය මත සිදුකරන වෙනස්කොට සැලකීම ඔවුන්ගේ ජීවිතයේ සෑම අවදියකමම හඳුනාගත හැකිය. මෙවැනි සමාජ සංදර්භයක් ස්ත්‍රිය සහ පුරුෂයා අතර සංසන්දනාත්මක තත්ත්වයක දී විග්‍රහ කිරීමේ දී ආබාධ සහිත බව සැලකීමේ දී ආබාධ සහිත ස්ත්‍රිය වඩාත්ම අවධානමකට ලක් වේ ( Parker, 1993). පුණ්‍ය පරමාර්ථ මූලික කරගෙන සිදුවන සැලකීම සාමාන්‍යයෙන් අප සමාජයේ දී දක්නට ලැබෙන දෙයක් වුවත් මෙම කෘතිය තුල දී එම තත්වය දක්නට නොලැබුණු. ගොත බව සහජයෙන් උරුම කරගත් ඉසබෙලාගේ ප්‍රත්‍යෙකයෙන් ද හෙළි වූයේ ආබාධිතභාවය සම්බන්ධ මා කළ පර්යේෂණ වලින් සොයාගත් කරුණු සමපාත බවයි. ගායි දක්වන ආකාරයට ආබාධිතභාවය යනු පෞද්ගලික ප්‍රශ්නයක් හා ශෝකාන්තයක් වන බවයි. මා තනිව උසුලනු ලබන දෙයක් ලෙස ඇය ජීවත්වන සමාජය කාවද්දා තිබෙන බවයි (Ghai, **2003).** චිත්‍රපටි නාට්‍ය වලදී සිදුවන බැහැර කිරීම් සංස්කෘතික ක්‍රියාකාරකම් වලින් බහිස්කරණය වීම, විනෝදය සඳහා යොදා ගැනීම, ආබාධ සහිත ප්‍රජාවන් ඔවුන්ගේ සීමාකම් තේරුම් ගනිමින් සාමාන්‍ය ලෝකය සමඟ කළමණාකරණය කර ගැනීමට බලවත් උත්සාහයක් ගත්තද සමාජයෙන් නිරන්තරයෙන් ඔවුන්ගේ ජීවිත පාලනය පර්යේෂිකාව විසින් සොයාගෙන ඇති ප්‍රතිජානාත්මක පැතිකඩයන් අතර වේ.

සමාජ ඇතුළත් කිරීම සහ බැහැර කිරීම සමාජ වැඩ භාවිතයේ එදිනෙදා අවධානයට ලක් වේ සමාජ සාධාරණත්වයේ මූලධර්ම මානව හිමිකම් සාමුහික බව සැලකිල්ලට ගනිමින් වගකීම් සහ විවිධත්වයන්ට ගරු කිරීම සමාජ වැඩ සඳහා කේන්ද්‍රීය වේ (IFSW, 2014). එය අප අරමුණු කරන්නේ කුමන ආකාරයේ ලෝකයක් සඳහා ද යන්න ප්‍රකාශ කිරීම අපට අපහසු නොවිය යුතු ද අප මෙයට පිළිතුරු දෙන විට ඇතුළත් වන ලෝකය පොදු තේමාවන්ගෙන් එකක් ලෙස ඉස්මතු විය හැකියග අප වෙනස්කම් හා විවිධත්වයට සලකන ආකාරය පෙන්නුම් කරන්නේ අප කෙබඳු සමාජයක් ද යන්නයි. ආබාධ සහිත පුද්ගලයින් පමණක් නොව සෑම කෙනෙකුම ගරු කරන එවැනි ලෝකයක් අවශ්‍ය වේ.

මානව විවිධත්වය හෝ වෙනස්කම් එය සැමටම නිර්මාණය කර ඇති අතර එය පමණක් නොවේග බහුතරය නිශ්චිත අවශ්‍යතා සඳහා වෙනස් කිරීමට සහ ඒවාට අනුගක වීමට කැමති සහ සෙසු මිනිසුන්ගේ උත්සුකයන් වන අතරල එමගින් එක් එක් අයට අවස්ථාවන් ප්‍රවේශය ලැබේග ඔවුන්ගේ හැකියාවන් සාක්ෂාත් කර ගැනීමට පුද්ගලයා සෑම කෙනෙකුම එවැනි නිර්මාණය කිරීමේ කොටසක් විය යුතුය.

මෙම කෘතිය පර්යේෂණාත්මක වැදගත්කමක් සහිත කෘතියක් වන්නේ දරුවන් සමාජානුයෝජනය කිරීමේ කේන්ද්‍රීය භූමිකාව උසුලන දෙමාපියන්ට දරුවන්ට පරිකල්පන හැකියාව ගොඩනගන සංවේදීමය අවදිය වන කතන්දර කියා දීමට පටන් ගත් අවදියේ සිටම දරුවන්ට වෙන්සකම් පිළිගැනීමට සහ අගය කිරීමට මෙන්ම සමානාත්මතාවය යන මූලධර්මය පිළිබුදව අවබෝධ කරවීමට ඇති හැකියාව ගොඩනුගන්නට යොදාගත හැකි ප්‍රබල මෙවලමක් ලෙස මෙම කෘතිය පරිහරණය කිරීමෙන් උද්දීපනය කරගත හැකිය.

පාසැල් දරුවන් අතර වැඩකිරීමේ දී කථන-භාෂා ආබාධ/කථන ප්‍රමාදයන්/ පාසැල් පසුබිමේ වෙනස්කම් ඇති දරුවන් සමග වැඩ කිරීමට අවශ්‍ය මඟ පෙන්වීම මෙම කෘතිය මඟින් ලැබේ. එය සැබවින් ඇස් ඇරීමකි. ධරුවන් දෙමාපියන් සහ ගුරුවරුන් කථන ආබාද පිළිබඳව සංවේදීකරණ වැඩසටහන් කිරීම දැනුවත් කිරීමේ වැදගත්කම පිළිබඳ මෙම කෘතිය මඟින් අවධාරණය කරනු ලැබේ.

සමාජයේ මුල්බැසගෙන ඇති අගතීන් මිනිසුන්ට ඉවසිලිවන්තව කටයුතු කිරීමෙන් වෙනස්කල හැකි බවත් විවිධත්වය සමඟ ජීවත් වීමට ඇති හැකියාවට සහාය දැක්වීමට විවිධ වයස් මට්ටම් නියෝජනය කරන පාඨකයාට පූර්ණ අවබෝධයක් ලබාදේ. මෙම කෘතිය පාසැල් විෂය නිර්දේශ වල අන්තර්ග්‍රහණ අධ්‍යාපනය (Inclusive Education) පිළිබඳ ඉගැන්වීමේ අත්පොතක් ලෙස ද නිර්දේශ කල හැකිය.

**නිගමනය**

ආබාධිතභාවය සම්බන්ධ ආචාරධර්ම මඟින් මතුකරන වැදගත් පණිවිඩයක් වන විවිධ කායික ඉන්‍ද්‍රියබද්ධ සහ මානසික සුවිශේෂතා තිබිය දී වුව ද දරුවන් ඇතුළුව සියළු මිනිසුන්ට සමානත්වයෙන් සැලකිය හැක්කේ කෙසේදැයි මෙම කෘතිය මඟින් පෙන්වා දෙන අතර සමජයක් ප්‍රගතිශීලී පරිවර්තනය කිරීමේ දී අපි කියන අපි අසන කතන්දර මඟින් අපේම ජීවන අත්දැකීම් ප්‍රතිනිර්මාණය වන නිසා කතන්දර සමාජ වැඩ මෙවලමක් ලෙස යොදා ගත හැකි බව පෙන්වා දිය හැකිය.

සමාජ වැඩ භාවිතයට අදාළ න්‍යායායන්, ශිල්පීය කුසලතා සහ ආකල්ප සංවර්ධනයට අවශ්‍ය පසුබිම ඉසබෙලාගේ කතන්දරයෙන් මැනවින් නිරූපණය වේ. ජීවන යථාර්ථයක් නිරූපණය කරමින් සිදුකරන අත්දැකීම, කතා ප්‍රවෘත්තිය සංකේත භාවිතකරමින් ඉදිරිපත් කිරීම ආකල්ප සංවර්ධනය මූලික කරගෙන ලබා දෙන ජීවන දෘෂ්ටිය භාෂා භාවිතය මෙන්ම පසුබිම් නිරූපණයද ආකර්ශණීය චිත්‍ර එකිනෙකට සිද්ධි සමඟ පෙළගස්වමින් කතන්දරය සමාජය වෙනස් කිරීමට යොදා ගත හැක්කේ කෙසේද යන්න කෘතියෙන් මැනවින් සාකච්ඡා වේ.

සමාජ වැඩ භාවිතයට මෙම කතන්දර එක් කිරීමට උනන්දුවක් දක්වන සමාජ වැඩ වෘත්තිකයින් සඳහා, ලෝකයේ ඕනෑම තැනක සිට සමාජය වෙනස් කිරීමට කථාන්දර යොදා ගත හැකිය. පුරාවෘත්ත, මිථ්‍යාවන්, පූජනීය ග්‍රන්ථ සහ ලෝක සාහිත්‍යය කතන්දර පරිවර්තනය, මිනිස් ජීවිතයක සහජ වටිනාකම සහ බාධක ජය ගැනීම වැනි තේමාවන්ගෙන් සමන්විත වේ. ඉසබෙලා කෘතියෙන් මතු කරන ආබාධිතභාවය සම්බන්ධ පමණක් නොව ඕනෑම අද්විතීය අත්දැකීම්, දැනුම සහ රුචිකත්වයන් සමාජ වැඩ වෘත්තීයෙහි ප්‍රගතිය සඳහා යොදා ගත හැකි බව පර්යේෂකිවගේ නිර්දේශයයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**


හේරත්, එම්. කේ. සුභාංගි. (2018). *ඉසබෙලා ගොත ගසන කුමරියගේ කතාව*. නුගේගොඩ:සරසවි ප්‍රකාශයෝ.

ජයසේන, චන්දිමා (2020). *ඉසබෙලා ගොත ගැසූ කුමරියගේ කථාව ආබාධිත ප්‍රජාව බලගැන්වීමේ දී යොදාගත හැකි මෙවලමක්* http://www.aithiya.lk_ඉසබෙලා_-ගොත-ගැසූ_ accessed on 17/06/2020

Ghai, A. (2003). (Dis) embodied form: Issues of disabled women. New Delhi: Shakti Books.

Giddens, A. (2006). *Sociology* (5th edition) UK: Polity press.

Herath,S. (2015). *The Politics of Aesthetics in Negotiating Identity Among Univesity Students with Disabilities in Sri Lanka*: Teorija in Praksa: University of Lublijana.

J. Campbell, & M. Oliver. (1996). *Disability Politics: Understanding Our Past Changing Our Future*. London: Routledgea.

Mooney, A.L., D.Knox & C.Schacht. (2000). *Understanding Social Problems*. (2nd ed). London: Wadswort Thomson Learning.

Parker, G. (1993). *With this Body: Caring and Disability in Marriage*. Buckingham: Open University Press.

White, M., & Epston, D. (1990). *Narrative means to therapeutic ends*. New York: W. W. Norton & Company.

Akerman, Beyata. (2013). http://isad.isastutter.org/isad-2013/papers-presented-by-2013/its-not-funny-and-there-is-no-reason-to-laugh accessed on 28.06.2020

Global Definition of Social Work, (2014 ) https://www.ifsw.org/what-is-social-work/global-definition-of-social-work/ accessed on 17/06/2020

Janssen, S.(2013). Stories We Tell, Stories We Hear-Valuable Therapeutic Tools. https://www.socialworktoday.com/archive/exc_0519_4.shtml accessed on 23/06/2020

Tricia B. Bent-Goodley. The Art and Science of Social Work Revisited: Relevance for a Changing World Social Work, Volume 60, Issue 3, July 2015, Pages 189–190, https://doi.org/10.1093/sw/swv020 Published: 01 May 2015

Yashinsky, D. (2017, June 2). 'Storycare' should be an essential part of health care. The Star. Retrieved from https://www.thestar.com/life/2017/06/02/storycare-should-be-an-essential-part-of-health-care.html.

Zaviršek, D. (2008), Social Work as memory Work in Times of Political Conflict. In: Shulamit Ramon (ed.) Social work in the Context of Political Conflict. Venture press: Birmingham. Pp. 147-168. file:///F:/Social%20Work%20Memory/Darja_Zavirsek_2008_Social_Work_as_memor.pdf accessed on 24/06/2020

https://academic.oup.com/sw/article-abstract/60/3/189/2280679 accessed on 13/06/2020

https://www.academia.edu/2954979/Social_Work_in_a_Risk_Society accessed on 26/06/2020

https://www.disabledworld.com/definitions/disabilitydefinitions.php#:~:text=Under%20the%20ADA%2C%20an%20individual,record%20of%20such%20an%20impairment accessed on 28/06/2020

https://www.disabled-world.com/definitions/disability-models.php accessed on 29/06/20